ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

# පුවත්පත් නිවේදනය

## අග්‍රාමාත්‍යතුමාගේ සහ අමාත්‍ය මණ්ඩලයේ දිවුරුම් දීමේ උත්සවයට නායකයන් රැසක්

2024 මහ මැතිවරණයෙන් අනතුරුව අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ සහ අමාත්‍ය මණ්ඩලයේ දිවුරුම් දීමේ උත්සවය 2024 ජූනි 09 වන දින පැවැත්වීමට නියමිතය. මේ සඳහා ඉන්දියාවේ අසල්වැසි රාජ්‍යයන්ගේ සහ ඉන්දියානු සාගර කලාපයේ රටවල නායකයන්ට සම්භාවනීය අමුත්තන් ලෙස සහභාගී වන ලෙස සුහදව ඇරයුම් කර තිබේ.

2. ශ්‍රී ලංකා ජනාධිපති රනිල් වික්‍රමසිංහ; මාලදිවයින් ජනාධිපති ආචාර්ය මොහොමඩ් මුයිසු, සීෂෙල්ස් උප ජනාධිපති අහමඩ් අෆිෆ්, බංග්ලාදේශ අග්‍රාමාත්‍ය ෂීක් හසීනා, මොරිෂස් අග්‍රාමාත්‍ය ප්‍රවින්ද් කුමාර් ජුග්නෝත්, නේපාල අග්‍රාමාත්‍ය පුෂ්ප කමල් දහාල් 'ප්‍රචණ්ඩා' සහ භූතාන අග්‍රාමාත්‍ය ෂෙරින්ග් ටොබ්ගේ යන මහත්ම මහත්මීන් දිවුරුම් දීමේ උත්සවයේ ඇරයුම් භාර ගෙන ඇත.

3. දිවුරුම් දීමේ උත්සවයට සහභාගී වීමට අමතරව නායකයන් එදිනම සන්ධ්‍යාවේ ජනාධිපතිනි ශ්‍රීමති ද්‍රෞපදී මුර්මු මැතිනිය විසින් රාෂ්ට්‍රපති භවන් හිදී පිරිනමනු ලබන භෝජන සංග්‍රහයකට ද සහභාගී වනු ඇත.

4. ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා අඛණ්ඩව තෙවන වරටත් අග්‍රාමාත්‍යවරයා ලෙස දිවුරුම් දීමේ උත්සවය සඳහා මෙම නායකයන්ගේ සහභාගිත්වය ඉන්දියාව විසින් සිය 'අසල්වැසියා ප්‍රථමයෙන්' යන ප්‍රතිපත්තියට සහ 'SAGAR' දැක්මට ලබාදෙන ඉහළම ප්‍රමුඛත්වය අවධාරණය කරයි.

***

කොළඹ
2024 ජූනි 08

මූලාශ්‍රය:

https://www.mea.gov.in/press-releases.htm?dtl/37855/Visit_of_leaders_for_the_swearingin_ceremony_of_Prime_Minister_and_Council_of_Ministersඞ